“එය වනාහි, එහි ජලය පිරිසිදුය. එහි මියගිය දෑද අනුමතය.” යැයි පැවසූහ

අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී: මිනිසෙකු අල්ලාහ්ගේ දූතයාණන්ගෙන් (සල්ලල්ලාහු අලයිහි වල්ලම්) මෙසේ විමසීය. “අහෝ අල්ලාහ්ගේ
දූතයාණනි! සැබැවින්ම අපි සාගරයේ ගමන් කරන්නෙමු. අප සමග අපි උසුලාගෙන යන ජලය සුළු ප්රමාණයකි. අප එයින් වුළූ ගත් විටක අපි පිපාසයෙන් පෙළෙන්නෙමු. එබැවින් සාගර ජලයෙන්
අපට වුළූ ගත හැකි ද? යැයි විමසීය. එවිට අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) “එය වනාහි, එහි ජලය පිරිසිදුය. එහි මියගිය දෑද අනුමතය.” යැයි පැවසූහ.
[පූර්ව සාධක සහිත හදීසයකි]

මිනිසෙකු අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වල්ලම්) ගෙන් "සැබැවින්ම අපි මසුන් ඇල්ලීම, ව්යාපාරික කටයුතු හා එවැනි වෙනත් අවශ්යතා සඳහා සාගරයේ නැව් මත නැගී ගමන් කරන්නෙමු. අප සමග පානීය ජලය රැගෙන යන්නේ සුළු ප්රමාණයක් පමණි. පානීය ජලය වුළූ ධෝවනය සඳහා හෝ නෑම සඳහා හෝ යොදා ගත්තේ නම්, එය අවසන් වී යනු ඇත. පසුව අපට බීමට ජලය අහිමි වී යයි. එබැවින් සාගර ජලයෙන් අපට වුළූ කළ හැකි ද?" යැයි විමසීය. එවිට අල්ලාහ්ගේ දූතයාණෝ (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මුහුදු ජලය සම්බන්ධයෙන් මෙසේ පැවසූහ. "එහි ජලය පිරිසිදු වන අතර (වෙනත් දෑ) පිරිසිදු කරනු ඇත. ඉන් වුළූ ගැනීමට හා ස්නානය කිරීමට අවසරය ඇත. මසුන් ඇල්ලීමෙන් තොරව ඉන් මතුපිටට එන මත්සයින් හා මුහුදු ජීවීන් මිය ගිය දෑ වුව ද, ඒවා අනුභව කිරීමට අනුමැතිය ඇත."

https://sunnah.global/hadeeth/si/show/8355